## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2015

-----------------------------------------------

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වූ ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් අය විය යුතු බැඳුම්කර වටිනාකම 2010 දෙසැම්බර් 31 දින දක්වා උපචිත පදනම මත ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද 2011 ජනවාරි 01 දින සිට මුදල් පදනම යටතේ ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන බව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර තිබුණි. මෙම ප්‍රතිපත්තිය වෙනස්වීම නිසා 2011 වර්ෂයට පෙර වර්ෂ සඳහා උපචිත පදනම මත ගිණුම්ගත කර තිබූ රු.40,812,562 ක ලැබිය යුතු බැඳුම්කර වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව අතීතයානුයෝගීව ගලපා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1990 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද මහරගම නගර සභාව වෙත ගෙවා ඇති රු.1,310,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රසායනාගාර විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ දී කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු.2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු.1,764,013 ක මුදල අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දීද කටයුතු කර නොතිබුණි.

(ඇ) වැලිකඩ බන්ධනාගාර රැඳවියන්ගේ ලිංගික සෞඛ්‍යය දැනුවත්භාවය හා ලිංගාශ්‍රිත රෝග ව්‍යාප්තිය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් සඳහා 2014 අගෝස්තු 20 දින කථිකාචාර්යවරයකු ලබාගත් රු.400,000 ක අත්තිකාරම් මුදලින් රු.366,720 ක් 2016 අගෝස්තු මාසය වන විටද පියවා නොතිබුණු අතර, අදාල පර්යේෂණයද සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විවිධ අත්තිකාරම් ලෙස දක්වා ඇති රු.1,141,097 ක් වූ ශේෂයේ ඇතුළත් වර්ෂ 10 සිට වර්ෂ 14 දක්වා පැරණි රු.684,373ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.93,549,873 ක් වූ ඇප බැඳුම්කර ණයගැතියන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 15 කට වඩා පැරණි රු.16,411,708 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළද කටයුතු කර නොතිබුණි.

(ඊ) ගිවිසුම්වලට එළඹීමකින් තොරව නිලධාරීන් වෙත විශ්වවිද්‍යාලය සතු නිල නිවාස 18 න් 16ක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.321,300 ක නිවාස කුලී මුදලින් රු.258,300 ක් එනම් සියයට 80 ක් අයකර ගෙන නොතිබුණි.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ X වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | 2005 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2002 මැයි 16 දිනැති අංක 803 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 සැප්තැම්බර් 16 දිනැති අංක DMS/7777/TDP/SJP දරන ලිපියේ තුන්වන ඡේදය | විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය ව්‍යාපෘති කළමනාකරු, ව්‍යාපෘති පරිපාලන නිලධාරී, ප්‍රමාණ සමීක්ෂක සහ තාක්ෂණ නිලධාරී යන තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීමේ දී අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස් සීමාව ආදිය නොසලකා සහ පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමෙන් තොරව එම බඳවා ගැනීම් සිදු කර තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45.2 (xv) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 153 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. විශ්වවිද්‍යාලයේ භෞතික හා අධ්‍යයන සංවර්ධනය සඳහා යෙදවිය හැකි මුදල්වලින් සමාලෝචිත වර්ෂය අවසානයට එලෙස ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු මුළු මුදල රු.මිලියන 862 ක් විය.

(ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් මානව සම්පත් සැලැස්මේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව ඉක්මවා තාවකාලික ප්‍රදර්ශකවරුන් හා තාවකාලික උපදේශකවරුන් 61 ක් බඳවාගෙන තිබුණි. විශ්වවිද්‍යාල පීඨයන්ට ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය ප්‍රමාණය වැඩිවීම හා පාඨමාලා වැඩිවීම මෙම බඳවා ගැනීමට හේතු වූ බව විගණනය වෙත වාර්තා කර තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.17,883,619 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.145,069,392ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.162,953,011ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රදාන රු. 529,744,143 කින් වැඩිවී තිබුණද අභ්‍යන්තර ආදායම රු.41,135,151 කින් අඩුවීම හා වියදම් විෂයයන් 8 ක් රු.636,061,991 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ අතිරික්තය 2012 වර්ෂය වනවිට ඌනතාවයක් බවට පත්වී නැවත එය ක්‍රමයෙන් වර්ධනය වී 2014 වර්ෂය වනවිට අතිරික්තයක් බවට පත්වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී එය සියයට 112 කින් පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැළකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ රු.2,629,820,066 ක්වූ දායකත්වය 2013 වර්ෂය වනවිට සෘණ අගයක් දක්වා ක්‍රමයෙන් පිරිහී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.2,234,235,101 ක් වී තිබුණි.

3.2 **වියදම්වල අසාමාන්‍ය වැඩිවීම**

**-------------------------------**

ඉකුත් වර්ෂයේ රු. මිලියන 9.97 ක්වූ ගමන් වියදම් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 27.59ක් දක්වා රු. මිලියන 17.62 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ විදේශ ගමන් වියදම රු.මිලියන 23.57 ක්වූ අතර එය සමස්ත ගමන් වියදම් ප්‍රමාණයෙන් සියයට 85.43 ක් විය.

3.3 **විශ්වවිද්‍යාලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

**---------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර විභාග අංශයේ කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා විශ්වවිද්‍යාලයට ඉඩමක් පවරා ගැනීමට එරෙහිව එහි හිමිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් පවරා තිබුණි.

(ආ) සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ සේවය දීර්ඝ නොකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් තුන්දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ නඩු 03 ක් සහ විශ්‍රාම ගැන්වීම, සේවය අතහැර ගියා සේ සැලකීම හා පාරිතෝෂික නොගෙවීම ආදිය සම්බන්ධයෙන් නිලධාරීන් තුන්දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ නඩු 03 ක් පවරා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

4.1 **කාර්යසාධනය**

**----------------**

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ දේශන ප්‍රතිමාන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දේශන පැවැත්වීමේ ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයනාංශය තුල ස්ථිර සේවයේ නියුතු දේශකවරු 18 දෙනෙකුගෙන් 11 දෙනෙකුටම දේශන ප්‍රතිමාන සැලැස්ම ප්‍රකාරව තනතුරු අනුව ලබා දිය යුතු අවම දේශන පැය ප්‍රමාණය ලබා දී නොතිබුණි. ඒ අනුව සතියකට අවම වශයෙන් දේශන පැය 12 ක් ආවරණය කළ යුතු කථිකාචාර්යවරියකට එකදු දේශන පැයක් හෝ ලබා දී නොතිබුණි.

(ආ) අවම දේශන පැය ප්‍රමාණය ලබා නොදුන් ආචාර්යවරුන් 11 දෙනෙකු සිටිය දී විෂයයන් 5කට අදාලව දේශන පැය 150 ක් සඳහා බාහිර කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි.

(ඇ) සති 15 ක අධ්‍යයන කාලය තුළ විෂයයන් 22 ක විෂය නිර්දේශ ආවරණය සියයට 47 සිට සියයට 73 දක්වා අඩු පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාව පිළිබඳ ජාතික උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය (NCAS) මගින් ලබා දෙන ආධාර යටතේ ආචාර්ය උපාධියක් හැදෑරීම සඳහා 2006 නොවැම්බර් 08 දින සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්යවරයකු සමග ගිවිසුමකට එළඹ රු. 250,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 09 ක් ගත වී ඇතත් ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් පර්චස් 10.7 ක බිම් ප්‍රමාණයක් අවුරුදු 25 ක බදු කාල සීමාවකට මහජන බැංකුවට ලබා දී තිබුණු අතර, එම කාල සීමාව අවසානයේ අදාල ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලය වෙත පැවරීමට දෙපාර්ශවය එකඟ වී ගිවිසුමක් අත්සන් කර තිබුණ ද එම ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණි. එසේම ගිවිසුම් ප්‍රකාරව මෙම ගොඩනැගිල්ල වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණු අතර, 2008 වර්ෂයේ තක්සේරු වටිනාකම් මත කුලී අය කිරීම හේතුවෙන් ප්‍රමාණවත් කුලියක් අයකරගෙන නොතිබුණි.

(ඇ) මුදල් ලැබීම් හා එම ලැබීම් වලට අදාල කාල වකවානු නිවැරදිව තක්සේරු කිරීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා ගණනාවකදීම මුදල් පොතේ ඍණ ශේෂයන් පැවතුණි. ඒ අනුව මෙම ඍණ ශේෂය රු. මිලියන 139 දක්වා වර්ධනය වූ අවස්ථා ද නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලොව පුරා පවතින විශ්වවිද්‍යාල අතර දේශීය විශ්වවිද්‍යාල ඉහළ ස්ථානයකට ගෙනඒමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වන ලෝක විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ 2011 වර්ෂයේ දී ආරම්භ කළ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. මිලියන 121.69 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.මිලියන 117.24 ක් වැය කර තිබුණ ද ඉන් රු. මිලියන 22.76 ක් ව්‍යාපෘතියට අදාල නොවූ ඇස්තමේන්තුවෙන් බැහැර වියදම් සඳහා යොදාගෙන තිබුණි.

(ii) ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී පර්යේෂණ සහ උපුටා ගැනීම් වෙනුවෙන් සියයට 60 ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බැවින් එම ඉලක්කය සපුරා ගැනීම සඳහා

පර්යේෂණ 24 ක් සැලසුම් කර තිබුණු අතර රු.මිලියන 54.06 ක ප්‍රතිපාදනද සලසාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉන් පර්යේෂණ 05 ක් පමණක් අවසන් කර තිබුණු අතර තවත් පර්යේෂණ 05 ක් අතරමග අත්හැර දමා තිබුණි. ඉතා මන්දගාමී තත්ත්වයෙන් ක්‍රියාත්මක වන සෙසු පර්යේෂණවලින් දෙකකට අදාලව ප්‍රගති වාර්තාවක් හෝ ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා පොදු විද්‍යාගාර පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව රු. මිලියන 68 ක විද්‍යාගාර උපකරණ මිලදී ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද එම උපකරණ ව්‍යවහාරික හා වෛද්‍ය පීඨ භාරයේ පැවතුණි. පොදු විද්‍යාගාරය වෙනුවෙන් ගොඩනැගිල්ලක ඉඩ පහසුකම් වෙන් කිරීම සඳහා රු. 495,664 ක් වැය කර තිබුණ ද පසුව එය අතහැරදමා තිබුණි.

(iv) ව්‍යාපෘතිය ආරම්භ කළ 2011 වර්ෂයේ දී ලෝකයේ අනෙකුත් විශ්වවිද්‍යාල අතර 5330 වැනි ස්ථානයේ පැවති විශ්වවිද්‍යාලය 2012 වර්ෂයේ දී 2758 දක්වා ඉහළ ගොස් තිබුණු නමුත් ඉකුත් වර්ෂයේ ජුනි වන විට නැවත 3091 දක්වා පහළ බැස තිබුණි. සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේ ප්‍රසිද්ධ කළ වාර්තා අනුව විශ්වවිද්‍යාලයේ තත්ත්වය 4268 දක්වා තවදුරටත් පහළ බැස තිබුණි.

මේ අනුව ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඉහළ මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය මිනුම් සංරචක තෘප්ත කිරීමට ප්‍රමාණවත් මෙහෙයුම් කාර්යසාධනයක් ලබාකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද විශ්වවිද්‍යාලය සමත්ව නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) යෝජිත ඉංජිනේරු හා තාක්ෂණ විද්‍යා පීඨය සඳහා පත් කළ උපදේශකවරු 17 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දක්වා දීමනා වශයෙන් රු. 8,025,000 ක් ගෙවා තිබුණි. එම පත්වීම්වලට අදාල වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතීන් සහ දීමනාවල ප්‍රමාණය තීරණය කිරීම සඳහා යොදා ගනු ලැබූ පදනම පිළිබඳව විමසීමේදී ඉංජිනේරු හා තාක්ෂණ විද්‍යා පීඨයේ ආරම්භක වියදම් වශයෙන් අදාල වියදම් දැරීම පාලක සභා අනුමැතිය මත සිදුකළ බව විගණනය වෙත වාර්තා කර තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

විවිධ දක්ෂතා දක්වන සිසුන්ට ත්‍යාග පිරිනැමීම පිණිස පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන මුදල්වලින් සමන්විත ත්‍යාග අරමුදල් ශුන්‍ය නොවී පවත්වාගෙනයාම සඳහා ඒවා ආයෝජනය කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.22,525,707ක් වූ ත්‍යාග අරමුදල් 73 කින් රු.17,636,055 ක් පමණක් ආයෝජනය කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිසුන් 300 කට නේවාසිකාගාර පහසුකම් සපයා දීමේ අරමුණින් 1998 මැයි 05 දින රු.මිලියන 1.6ක් ගෙවා මිලදී ගත් පර්චස් 41.31ක ඉඩමේ බුක්තිය 2003 අගෝස්තු 06 දින විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉඩම අරමුණුගත කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර සඳහා භාවිතා කිරීමට මිලදී ගත් ටෝනර් තොග ශේෂය තුල රු.4,323,216ක් වටිනා යල්පැනගිය හා සෙමෙන් චලනය වන තොග පැවති අතර ඉන් ටෝනර් වර්ග 19 කට අදාලව සැලකිය යුතු තොග ශේෂයක් තිබියදී හා

අවශ්‍යතාවය අනුව ඉල්ලුම් කිරීමකින් තොරව මිලදී ගැනීම හේතුවෙන් රු.2,021,408 ක් වටිනා ටෝනර් තොගයක් ගබඩාවේ ඉතිරිව තිබුණි.

(ඈ) වසර 05 කට වඩා පැරණි රු.191,416 ක් වටිනා තීන්ත වර්ග, රු.377,087 ක් වටිනා රෙදිපිලි සහ රු.73,138ක් වටිනා පරිගණක ඩිස්කට් තොගයක් පැවති අතර ඒවා විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 **හඳුනාගන්නා ලද පාඩු**

**----------------------**

කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 70 ක් වූ විශ්වවිද්‍යාලයේ අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2003 අගෝස්තු 06 වන දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබී තිබුණු අතර එම ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික සැලසුම් සකස් කිරීම සඳහා ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු.2,336,090 ක් ගෙවා තිබුණි. පසුව අතරමග නවතා තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද මුදල නැවත අයකර ගැනීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඉදිරියට ගෙන එමින් පැවතුණි.

4.7 **කාර්ය මණ්ඩල පරිපාලනය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 1853ක් වූ අතර ඉන් නිලධාරීන් 293 කට අදාල තනතුරු පුරප්පාඩුව පැවතුණි. ඒ තුළ කථිකාචාර්ය තනතුරු 121 ක් පුරප්පාඩුව පැවති අතර, එය විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි බාධාවක්ව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු 9 දෙනෙකුට, කුසලතා පදනම මත උසස් කළ මහාචාර්යවරු 51 දෙනෙකුට සහ සහාය මහාචාර්යවරු 7 දෙනෙකුට ස්ථිර තනතුරු ප්‍රදානය කර තිබුණ ද අළුතින් ඇති කළ එම තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) තාවකාලික කථිකාචාර්ය ප්‍රදර්ශක සහ නිබන්ධක තනතුරු 210 ක් සඳහා පමණක් අනුමැතිය ලබා ගෙන තිබුණු නමුත් එම ප්‍රමාණය ඉක්මවා 54 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඈ) කාලීනව වැදගත් නොවන යතුරු ලේඛක තනතුරු 9 ක් සහ ලඝුලේඛක තනතුරු 8 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු වෙනුවට කාලීනව වැදගත් වන තනතුරු ඇති කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) අනුමත හා අනුමත නොවූ තනතුරුවලට ස්ථිරව සහ තාවකාලිකව බඳවාගෙන තිබුණු සමස්ත කාර්ය මණ්ඩලය 1681 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඒක සේවක පිරිවැය රු.1,152,475 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.914,638 ක් වූයෙන් රු.237,837ක ඒක සේවක පිරිවැයෙහි වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X වැනි පරිච්ඡේදයේ 20.5 වන වගන්තිය ප්‍රකාරව වැටුප් රහිත නිවාඩු කාලය ඇතුළත යෙදෙන සෙනසුරාදා, ඉරිදා රජයේ නිවාඩු දිනයන් වැටුප් රහිත නිවාඩු දින ලෙස සලකා කටයුතු කළයුතු වුවත් සිකුරාදා හා සඳුදා දින වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති ඇතැම් සේවකයන් සම්බන්ධයෙන් සෙනසුරාදා ඉරිදා දිනයන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු කර නොතිබුණි.

(උ) මූලාා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය තනතුරක පුරප්පාඩුවක් සඳහා අධ්‍යයනාංශ ප්‍රධානිගේ ඉල්ලීමක් අනුව 2015 ජූලි 15 දින සිට බඳවා ගත් ආධුනික කථිකාචාර්යවරයකුට වැඩ බාර

ගැනීමෙන් දින හයකට පසු එනම් 2015 අගෝස්තු 11 දින සිට වර්ෂ 05 ක අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. මූල්‍ය අධ්‍යයනාංශයේ කටයුතු පහසු කර ගැනීමට කඩිනමින් බඳවා ගනු ලැබූ මෙම කථිකාචාර්යවරයාට දින 6ක සේවයෙන් පසුව සම්පූර්ණ වැටුප් ලබමින් විදේශගතවීමට අනුමැතිය ලබාදීමේදී විශ්වවිද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාමට බාධා නොවන පරිදි කටයුතු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ඌ) 2006 අප්‍රේල් 06 දින පත්වීම් ලබා තිබූ ආධුනික කථිකාචාර්යවරියක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ 21.1.1 වන වගන්තිය ප්‍රකාරව අවුරුදු 3 ක පරිවාස කාලයක් තුළ පශ්චාත් උපාධියක් ලබාගෙන පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුව ද පරිවාස කාලය තුල පශ්චාත් උපාධිය ලබාගෙන නොතිබුණි. අවුරුදු 6ක් තුළ දී පශ්චාත් උපාධිය ලබාගැනීමට අසමත් වුවහොත් සේවය අවසන් කළ යුතු බව උක්ත වගන්තියේ වැඩිදුරටත් දක්වා ඇති නමුත් ඊට පටහැනිව නැවත වසර 03ක කාලයක් ලබා දී තිබුණි.

## 4.8. වාහන උපයෝජනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය සතුව වෙන් කළ වාහන 15 ක් හා සංචිත වාහන 30 ක් පැවති අතර ඉන් වාහන 5 ක් ගර්භිත තත්ත්වයේ පැවතුණි. නිලධාරීන්ට වෙන් කළ වාහන හැර අනෙකුත් සියළු වාහන සංචිතයට ඇතුලත් කර විධිමත්ව පාලනය කිරීමට කටයුතු කළ යුතු වුව ද ඇතැම් වාහන විධිමත් අධීක්ෂණයකින් තොරව අධ්‍යයන අංශවල කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.

(ආ) වාහන ලොග් සටහන් පොත් සහ දෛනික ධාවන සටහන් මුදල් රෙගුලාසි 1645 අනුව ද, ගමන් පිළිබඳ මාසික සාරාංශය මුදල් රෙගුලාසි 1646 අනුව ද පිළියෙල කිරීමේ දී එම මුදල් රෙගුලාසිවල සඳහන් උපදෙස් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යොදවා නොතිබුණු අතර නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් කාර්ය මණ්ඩලය සමන්විත විය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

ඉකුත් වර්ෂයේ තත්‍ය අභ්‍යන්තර ආදායම රු. මිලියන 305.84 ක්ව තිබිය දී සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර ආදායම රු.මිලියන 188.01 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම රු. මිලියන 443.68 ක් වූ අතර ඇස්තමේන්තුව ඉක්මවා සියයට 136 ක ආදායමක් ලබා තිබුණි. මේ අනුව අයවැය ලේඛණය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට හැකි වන පරිදි තාත්විකව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මුදාහැර තිබුණු කථිකාචාර්යවරියක වෙනුවෙන් ගෙවන ලද වැටුප් තුල ඇතුළත් අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා ඇති රු.1,437,882ක අධ්‍යයන දීමනා අදාළ කථිකාචාර්යවරියගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 05 ක බිම් ප්‍රමාණයක් ගැනීම වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවට 1994 වර්ෂයේදී රු. මිලියන 24 ක් ගෙවා තිබුණද, අදාල ඉඩම පවරා ගැනීමේ කටයුතු මන්දගාමීව සිදුවන අතර ඉන් දැනට පවරාගෙන ඇති ඉඩම් කොටස තක්සේරු කර ගිණුම්ගත නොකර ගෙවූ මුළු මුදල තවදුරටත් නොපියවූ ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දී රු.මිලියන 61.5 ක් වැය කර මිලදී ගත් කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන්ට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුළත්ව තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම සහ වත්කම් ප්‍රත්‍යාගණන කෙරෙහි යොමු නොවීම. |
| (ආ) | ගිණුම්කරණය | උපචිත පදනමෙන් බැහැරවීම් සහ ක්ෂය ගිණුම් තැබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම. |
| (ඈ) | ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය | අතිරික්ත මුදල් නිසි ලෙස පරිහරණය නොකිරීම. |
| (ඉ) | පර්යේෂණාධාර පිළිබඳ අභ්‍යන්තර පාලනය | පර්යේෂණාධාර උපයෝජනය පිළිබඳ පසුවිපරම් කිරීමේ හා ප්‍රගතිය මැනීම දුර්වල මට්ටමක පැවතීම. |
| (ඊ) | ගිවිසුම් හා බැඳුම්කර අයකිරීම | අයකර ගැනීම් කඩිනම් කිරීමට ප්‍රමාණවත් පියවර නොගැනීම. |
| (උ) | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු නොකිරීම. |